# A critical study on the multiplicity of the synonyms used for *Ālaya viññānaya* in the *Yōgāchara viññānavāda* philosophy

## යෝගාචාර විඥානවාදී දර්ශනයේ දැක්වෙනල ආලය විඥානය සඳහා යෙදී ඇති පර්යාය පදයන්ගේ විවිධත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

Karapikkada Sobitha

"යෝගාචාර විඥානවාදය" යනු මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ශ්‍රේෂ්ඨ දාර්ශනික ගුරුකුලයක මුඛ්‍ය ඉගැන්වීමකි. වෛඥානිකත්වය පදනම්ව භෞතිකත්වයේ ස්වභාවය හා පැවැත්ම පිළිබඳ විශ්ලේෂණයන් මේ තුළ ඉදිරිපත් වී ඇත. එමෙන් ම ක්ලේෂ, වාසනා, චෛතසික ආදි වූ ධර්මයන්ගේ ද පැවැත්ම හා ක්‍රියාකාරීත්වය උක්ත සම්ප්‍රදායානුගතව විඥානය පදනම්ව විග්‍රහ වේ. මෙහි දැක්වෙන්නා වූ වෛඥානික ක්‍රියාවලිය තුළ නොයෙකුත් ප්‍රභේදයන් ප්‍රකට වන අතර, එහි ප්‍රමුඛ ඉගැන්වීම වනුයේ ආලය විඥානය යි. සියලු විඥානයන් අතර ප්‍රමුඛ වන ආලය විඥානය හැඳින්වීම සඳහා යෝගාචාර දර්ශනයේ මෙන් ම, මහායාන සූත්‍ර සාහිත්‍යයේ ද පර්යාය පද රාශියක් යෙදී ඇත. එසේ ම එම පදයන්ගේ අර්ථයන් පිළිබඳ විමසීමේ දී ආලය විඥානයේ භාවිතාව හා ක්‍රියාකාරිත්වය යෙදී ඇත්තේ විවිධාකාර ලෙසින් බව පෙනේ. යෝගාචාර විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයෙහි ආලය විඥානය සඳහා **"සර්ව බීජක"** පදය යෙදී ඇති අතර, ඒ තුළින් සියලු ක්ලේෂ බීජයෝ එහි තැන්පත්ව ඇති බව දක්වා ඇත. එනම් වාසනා බීජ, මූල බීජ, අනාශ්‍රව බීජ, කර්ම බීජ, ක්ලේෂ බීජ, ස්මෘති බීජ ආදියයි. එසේ ම ආචාර්ය අසංගපාදයෝ මේ සඳහා **"ආදාන විඥාන"** යන පදය යොදා ඇත. ඒ තුළ ආලය විඥානය "ගෘහය" යන අරුතින් දක්වා ඇත. වස්තු රැස් කරන්නා වූ ස්ථානය ගෘහයයි. සියලු වාසනාවන් රැස් කරන බැවින් ආලය විඥානය ද ගෘහයක් මෙන් ක්‍රියාත්මක වන බව මෙයින් දක්වා ඇත. මීට අමතරව උප්පත්ති මරණද්වය ඇති කරවන කුශලාංශය කර්මයන්ගේ විපාක ඵලයන් මෙහි අන්තර්ගත බැවින් ආලය විඥානය **"විපාක ඵලය"** ලෙස ද, ඉතා පිරිසිදු අනාශ්‍රව ධර්මයන්ට ආශ්‍රය වන බැවින් **"විමල විඥානය"** ලෙස ද දක්වා ඇත. යෝගාචාර විඥනවාදය තුළ **පරමාලය විඥානය, විඥප්ති ආලය** යනුවෙන් විග්‍රහ වන්නේ ද මෙම ආලය විඥානයේ ම ක්‍රියාකාරිත්වයයි. එසේ ම මෙම පර්යාය පදයන්ට අමතරව මහායාන සූත්‍ර සාහිත්‍යය තුළ උක්ත විඥාන ධර්මය හැඳින්වීම සඳහා **ආශ්‍රය විඥාන, බීජ විඥාන, චිත්ත විඥාන** යන පදයන් ද යෙදී ඇති අයුරු දැකගත හැකිය. මේ අතර ආර්ය ලංකාවතාර සූත්‍රය ආලය විඥානය සඳහා යොදා ඇත්තේ **"තථාගත ගර්භ"** යන පදයයි. ක්‍රමවත්ව, අවිච්ඡින්නව, අඛණ්ඩව පැමිණි ගර්භය යනු එහි අදහසයි. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් ආලය විඥානය සඳහා යෙදී ඇති පර්යාය පදයන් තුළ එහි ක්‍රියාකාරිත්වය කෙසේ සිදුවන්නේ දැයි විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පද ; විඥානය, ධර්ම, ක්ලේෂ, ආලය, තථාතාවය.